මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: NPD/DCB/2024/GEN
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.04. 30

මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ: MF/02/2023 – (i)

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**විමධ්‍යගත අයවැය වැඩසටහන 2024**

විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 ට අදාළව 2023.12.29 දිනැතිව නිකුත් කරන ලද මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ MF/02/2023 ට අනුව අනුමත කරන ලද සියළුම ව්‍යාපෘතීන් 2024.07.31 දිනට පෙර අවසන් කල යුතුව ඇත. එසේ වුවද, නව ව්‍යාපෘති යෝජනා හා අනුමත ව්‍යාපෘති යෝජනා සංශෝධන විශාල වශයෙන් දිස්ත්‍රික්ක මට්ටමින් මේ වන විටත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කරන බැවින් එම යෝජනා වලට අදාළව සංශෝධනයන් සිදුවේ නම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තව දුරටත් ප්‍රමාද විය හැක.

2. එබැවින් උක්ත චක්‍රලේඛයේ 3.4 යටතේ දක්වා ඇති ව්‍යාපෘති යෝජනා සංශෝධනය කිරීමේ කාලය **2024 වර්ෂයේ මැයි මස 15** දින දක්වා දීර්ඝ කරන අතර එම දිනයෙන් පසුව ව්‍යාපෘති සංශෝධනයන් සිදු කිරීමට ඉඩදෙනු නොලැබේ.

3. තවද මෙම සංශෝධන සිදු කිරීමේදී සිදු විය හැකි ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ව්‍යාපෘති සංශෝධනය කිරීමේ බලය ඔබ වෙත පවරමි.

3.1. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලද ව්‍යාපෘතීන් සඳහා පමණක් අවශ්‍ය සංශෝධන සිදු කල හැකි අතර එම සංශෝධිත ව්‍යාපෘතීන්, විමධ්‍යගත වැඩසටහන සඳහා නිකුත් කර ඇති අංක MF/02/2023 දරණ හා 2023.12.29 දිනැති චක්‍රලේඛයට අනුකූල විය යුතුය.

3.2. 2024 විමධ්‍යගත අයවැය චක්‍රලේඛයේ අංක 2 හි සඳහන් සංවර්ධන අංශ යටතේ හඳුනාගත් ව්‍යාපෘති කාණ්ඩය තුලම පමණක් ව්‍යාපෘති සංශෝධනය කල යුතු අතර එම සංශෝධන අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුලම සිදු කල යුතුය. (උදා - අංක 2.5 යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් සංශෝධනය කල හැක්කේ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුලම වෙනත් සුදුසු මාර්ග ව්‍යාපෘතියක් පමණි.)

3.3. චක්‍රලේඛයේ අංක 2 යටතේ ඇති සංවර්ධන අංශයක ඉදිකිරීම් සඳහා අනුමත ව්‍යාපෘතියක්, ඉදිකිරීම් නොවන ව්‍යාපෘතියක් ලෙස සංශෝධනය නොවිය යුතු අතර එකම සංවර්ධන අංශයක පවතින අනුමත ඉදිකිරීම් නොවන ව්‍යාපෘතියක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ලෙස සංශෝධනය සිදු කිරීමේ හැකියාව පවතී.

3.4. මෙම සංශෝධන දිස්ත්‍රික්කයට වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ සිදු විය යුතුය.

3.5. සිදු කරනු ලබන ව්‍යාපෘති සංශෝධන පිළිබඳ තොරතුරු ඇමුණුම 1 හි සඳහන් ආකෘතියට අනුව අදාළ දිස්ත්‍රික් ලේකම් විසින් ජනාධිපති ලේකම් කාර්යාලය, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික

අයවැය දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. එසේම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර මෙම සංශෝධිත ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

3.6. ඉහත අංක 3.1 සිට 3.5 දක්වා ඇති සංශෝධනයන්ට පරිබාහිර ව්‍යාපෘති සංශෝධනයන් වේ නම් එම ව්‍යාපෘති යෝජනා කඩිනමින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය.

3.7. මේ වනවිටත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති සංශෝධනය කිරීමට යොමු කර ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් ද ඉහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

3.8. අනුමත වූ ව්‍යාපෘති යෝජනා 2024 වර්ෂයේ මැයි මස 15 වන දිනෙන් පසුව සංශෝධන කිරීමට කටයුතු නොකළ යුතුය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
ලේකම්

පිටපත් -

| | |
|---|---|
| 1. ගරු පළාත් ආණ්ඩුකාරවරු | - කාරුණික දැනගැනීම පිණිස |
| 2. සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු | - කාරුණික දැනගැනීම පිණිස |
| 3. ජනාධිපති ලේකම් | - කාරුණික දැනගැනීම පිණිස |
| 4. අග්‍රාමාත්‍ය ලේකම් | - කාරුණික දැනගැනීම පිණිස |
| 5. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් | - කාරුණික දැනගැනීම පිණිස |
| 6. විගණකාධිපති- විගණකාධිපති දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම පිණිස |
| 7. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කාරුණික දැනගැනීම පිණිස |
| 8. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | - කාරුණික දැනගැනීම පිණිස |
| 9. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 10. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 11. අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 12. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 13. අධ්‍යක්ෂ ජනරාල් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 14. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |
| 15. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - කාරුණික දැනගැනීම හා අ.ක.ස |

ඇමුණුම 1

විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024

ව්‍යාපෘති සංශෝධන

දිස්ත්‍රික්කය - ...................................

| අනුමත අංකය | ප්‍රා.ලේ කොට්ඨාශය | අනුමත ව්‍යාපෘතියේ නම | චක්‍රලේඛයේ 2 සංවර්ධන අංශ අනුව සංවර්ධන අංශය | වටිනාකම (රු.) | | සංශෝධිත ව්‍යාපෘති නාමය | චක්‍රලේඛයේ 2 සංවර්ධන අංශ අනුව සංවර්ධන අංශය | වටිනාකම (රු.) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඉදිකිරීම් ව්‍යාපෘති | අනෙකුත් ව්‍යාපෘති | | | ඉදිකිරීම් ව්‍යාපෘති | අනෙකුත් ව්‍යාපෘති |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

සකස් කලේ -

නිර්දේශය -

.........................................................

දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ

අනුමැතිය -

..............................................

දිස්ත්‍රික් ලේකම්

③-(i)